තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව ඉදිරිපිටදීය.

## එස්.කේ.ලියනගේ එ. ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය, තිඹිරිගස්යාය

RTIC Appeal (පුද්ගලික වශයෙන් විභාග කිරීම)/ 653/2018 (2019.06.10) දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේදී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය.

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචන කාර්යය පටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යය පටිපාටිය.
.

**සභාපති:** මහින්ද ගම්මම්පිල
**කොමිෂන් සභා සමාජික:** ජ්‍යෙෂ්ඨ නීතීඥ එස්. ජී. පුංචිහේවා
**කොමිෂන් සභා සමාජික:** විනිසුරු රෝහිණී වල්ගම

**අභියාචක** - එස්.කේ.ලියනගේ
**නොතිසි ලත් පාර්ශවය**- ප්‍රාදේශීය ලේකම්, තිඹිරිගස්යාය ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය

**පෙනීසිටීම**

අභියාචක -
පොදු අධිකාරිය - එච්.ඒ.වී.කේ. පලන්සූරිය -සහකාර ප්‍රාදේශීය ලේකම්
වයි.ආර්.එස්.ප්‍රදීපිකා-සංවර්ධන නිලධාරී

| | |
|---|---|
| තොරතුරු ඉල්ලීම ගොනු කරන ලද දිනය | 2018.02.01 |
| තොරතුරු නිලධාරියා තීරණය ලබා දුන් දිනය | 2018.02.21 |
| නම් කල නිලධාරියා වෙත අභියාචනය යොමු කළ දිනය | 2018.02.27 |
| නම් කල නිලධාරියා තීරණය ලබා දුන් දිනය | 2018.04.02 |
| තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත අභියාචනය යොමු කළ දිනය | 2018.04.18 |

**අභියාචනයට පසුබිම් වූ කරුණු**:
අභියාචක විසින් 2018.02.01 දිනැති තොරතුරු ඉල්ලීම මඟින් පහත තොරතුරු ඉල්ලා සිටින ලදි.

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව ඉදිරිපිටදීය.

(1) අභියාචකගේ 2017 අගෝස්තු 20 දිනැති ලිපිය තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට් ලැබී ඇත්තේ කවර දිනකද යන වග

(2) (I) එකී ලිපිය ලැබුණු දින සිට මේ දක්වා කාලය තුළ එය යොමු වූ එක් එක් නිලධාරියාගේ

(අ)නම

(ආ)තනතුරු නාමය

(ඇ)එකී නිලධාරියා වෙත එම ලිපිය යොමු කළ දිනය

(ඉ)එකී නිලධාරියා විසින් ඊළඟ නිලධාරියා වෙත එය යොමු කළ දිනය

(ඊ)ඉහත සඳහන් නිලධාරීන්ගේ විනය බලධාරීන් කවුරුන්ද යන වග

(II) (අ) දැනට එම ලිපිය ඇත්තේ කවර නිලධාරියෙකු භාරයේද යන වග

(ආ) එම නිලධාරියා වෙත එම ලිපිය භාර දී ඇති දිනය

(III) එම ලිපිය වෙනත් ආයතනයකට යවා ඇත්නම්

(අ) එකී ආයතනයේ නම

(ආ) එය එම ආයතනයට යවා ඇති දිනය

(IV) එම ලිපියට අදාළ රාජකාරි කටයුතු පැවරී ඇති

(අ) එක් එක් නිලධාරියාගේ නම

(ආ) එකී නිලධාරීන්ගේ තනතුරු නාම

(ඇ) එකී නිලධාරීන්ගේ විනය බලධරයන් කව්රුන්ද යන වග

(V) අභියාචකගේ 2017 අගෝස්තු 20 දිනැති ලිපියෙන් ඉල්ලා ඇති පරිදි අභියාචකට නියමිත අඩු නොකළ විශ්‍රාම වැටුප නියමිත පරිදි ගෙවීමට කටයුතු කරන්නේ කවර දිනකද යන වග

(3) අභියාචකගේ ඉහත කි ලිපියට අදාළව එකී ලිපියෙහි හෝ සටහන් පත්‍රවල

(අ) එක් එක් නිලධාරියා විසින් තබන ලද සටහන්වල

(ආ) කාර්යාලයේ වෙනත් නිලධාරීන් වෙත හෝ වෙනත් ආයතන වෙත ඉදිරිපත් කරන ලද ලිපිවල හා

(ඇ) එකී එක් එක් නිලධාරියා විසින් සහ/හෝ ආයතන විසින් එවන ලද ලිපිවල සහතික පිටපත්

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව ඉදිරිපිටදීය.

තොරතුරු නිලධාරියා 2018.02.21 දිනැතිව පිළිතුරු සපයමින් පවසා සිටියේ ඉල්ලීම් ලිපිය සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී කිසියම් ප්‍රමාද දෝෂයක් සිදුව ඇති බවත් 01-1114286 අංකය යටතේ එම විශ්‍රාම වැටුප සංශෝධනයට අනුව මූලික වැටුප රු.51876.76ක් ලෙස නිවැරදි කිරීමට කටයුතු යොදා ඇති අතර ඒ සඳහා ගෙවිය යුතු හිඟ වැටුප් ද ගණනය කර 2018 මාර්තු මාසය සඳහා ගෙවීම් සිදු කිරීමට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත යොමු කරන බවයි. මෙම ප්‍රතිචාරයෙන් අතෘප්තියට පත් අභියාචක විසින්2018.02.21 දිනැතිව නම්කළ නිලධරයා වෙත අභියාචනයක් යොමු කරන ලදී. නම්කළ නිලධරයා 2018.04.02 දිනැතිව ප්‍රතිචාර දක්වමින් පවසා සිටියේ ඉල්ලීම් කරන ලද තොරතුරු ලිපිය සමග එවා ඇති බවයි. මෙම තීරණයෙන් ද අභියාචක සෑහීමකට පත් නොවූ හෙයින් 2018.04.18 දිනැතිව අභියාචක විසින් කොමිෂන් සභාව වෙත අභියාචනයක් යොමු කරන ලදී.

**අභියාචනය සලකා බලන අවස්ථාවේදී උද්ගතවූ කාරණා:**

2019.06.10 අභියාචක නොපැමිණියේය. පොදු අධිකාරිය අවශ්‍ය තොරතුරු යැවූ බව පෙන්වා දෙයි. තොරතුරු ලැබී ඇති පදනම මත ගොනුවේ කටයුතු අවසන් කෙරේ.

**නියෝගය:**

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 3(1) වගන්තිය ප්‍රකාරව අභියාචක විසින් ඉල්ලුම් කොට ඇති තොරතුරු පොදු අධිකාරිය සතුව පවතින හෙයින්ද, 5(1) වගන්තියේ ව්‍යතිරේකයට යටත් නොවන හෙයින්ද, එම ඉල්ලීමට අදාළ තොරතුරු ලබා දී ඇති බැවින් අභියාචනය අවසන් කරනු ලැබේ.

කොමිෂන් සභා රීතීන්හි, රීති අංක 27 (ගාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය, ගැසට් අංක 2004/66, 2017.02.03) ප්‍රකාරව මෙම නියෝගය දෙපාර්ශවය වෙත සන්නිවේදනය කරනු ලැබේ.

******